# ඇබෑර්තු

## ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI)

## තාක්ෂණ අමාත්‍යාංශය

### ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ - ජ්‍යෙෂ්ඨ කළමනාකාර කාණ්ඩයේ (HM 1-1) තනතුරු

## ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉංජිනේරු) තනතුරු - 01

### 1. විදුලි හා විද්‍යුත් ඒකකය - ඉංජිනේරු ප්‍රමිතිකරණ අංශය

**සුදුසුකම්**

**බාහිර**

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධිය (සිව් වසර)

සමග

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත්, තනතුරෙහි විෂය පරාසයට අයත් අදාළ ක්ෂේත්‍රයේ පශ්චාද් උපාධි සුදුසුකම් හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු කවුන්සිලය පිළිගත් තනතුරෙහි විෂය පරාසයට අදාළ ආයතනික සාමාජිකත්වය සමග තනතුරට අදාළ ක්ෂේත්‍රයක කළමනාකාර ප්‍රභේදයේ වසර 13 ක පළපුරුද්ද.

**ඉහත තනතුර සඳහා පළපුරුද්ද.**

ප්‍රථම උපාධියෙන් පසු සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 13 ක අදාළ පළපුරුද්ද.

**අභ්‍යන්තර (පහත 01 හෝ 02)**

01. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.
02. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් තනතුරට අදාළ විෂය පරාසයේ පශ්චාද් උපාධි සුදුසුකම් හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු කවුන්සිලය ආයතනික සාමාජිකත්වය සමග තනතුරට අදාළ විෂය පරාසයේ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 13 ක පළපුරුද්ද.

තෝරාගනු ලබන අයදුම්කරු අංශයේ අධීක්ෂණ භූමිකාව දරනු ඇත. ඔහු / ඇය සෑම මට්ටමකම කාර්යය මණ්ඩලය හා සමග පහසුවෙන් කටයුතු කිරීමට විශිෂ්ඨ නායකත්වය හා සංනිවේදන නිපුණතාවන්ගෙන් හෙබි විය යුතුය.

**වැටුප් පරිමාණය :**

ශ්‍රී ලංරු. 80,295.00 - 15X2,270.00 - ශ්‍රී ලංරු. 114,345.00

**වයස :**

අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට වැඩි නොවිය යුතුය. (ඉහත වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ).

**වෙනත් ප්‍රතිලාභ :**

1. රාජ්‍ය ව්‍යාවසාය චක්‍රලේඛ අංක PED1/2015 හා PED1 / 2015 (i) පරිදි වෙන්කල වාහනයක් හෝ ප්‍රවාහන දීමනාව
2. භාවිත නොකල වෛද්‍ය නිවාඩු සඳහා මුදල් ලබා ගැනීම.
3. ජීවිත රක්ෂණාවරණ හා වෛද්‍ය රක්ෂණාවරණ
4. වෛද්‍ය වියදම් බිල්පත් සඳහා සීමාවකට යටත්ව ගෙවීම් කිරීම.
5. මහා භාණ්ඩාගාරය මගින් අනුමත පරිදි වාර්ෂික දිරිගැන්වීමේ දීමනා ගෙවීම්.
6. වෘත්තීය පරිසරයක සේවය කිරීමේ අවස්ථාවක් ලැබීම.
7. වෘත්තීය දීමනාව
8. සන්නිවේදන දීමනාව.

සම්පූර්ණ නම, වයස, අධ්‍යාපන සුදුසුකම් සහ වෙනත් අදාළ විස්තර සහිත අයදුම්පත්, සහතික පිටපත් හා ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සමග 2023-08-15 වන දින හෝ ඊට පෙර, **අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, නො. 17, වික්ටෝරියා පෙදෙස, ඇල්විටිගල මාවත, කොළඹ 08.** ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. රාජ්‍ය අංශයේ සේවයේ නියුතු අය තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. අයදුම් කරන තනතුර ලිපි කවරයේ වම් ඉහළ කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්,**

**ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය.**